සියලුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# අනාවරණ පරීක්ෂණය 2021

**8 ශ්‍රේණිය**

# ඉස්ලාම් ධර්මය

**කාලය පැය 02 යි.**

**නම/ විභාග අංකයඃ**

## I - කොටස

- සියළුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- ඉතා සුදුසු පිළිතුරු යටින් ඉරක් අඳින්න.

01 ''අර්රහීම්'' යනු

(1) ඉතා සමා කරන්නා (2) අසීමිත කරුණාවන්තයා

(3) ආහාර ලබාදෙන්නා (4) අපිරිමිත දයාවන්තයා

02 තව්රාත් ග්‍රන්ථය පහළ වූ භාෂාව වන්නේ,

(1) අරාබි (2) ග්‍රීක (3) හීබ්රු (4) බෙහ්ලවි

03 පළමුවන තක්බීරය යනුවෙන් හැඳින්වන්නේ,

(1) තවර්රුක් (2) දුආඋල් ඉෆ්තිතාහ් (3) තක්බීර්නහ්රීම් (4) ඉප්තිරාෂ්

04 පහත සඳහන් සලාතයන් අතරින් කණ්ඩායම් වශයෙන් ඉටුකල නොහැකි නෆිල් සලාතය

(1) ග්‍රහණ සලාතය (2) සලාතුල් ඉස්තිහාරා

(3) තරාවීහ් සලාතය (4) ඊද් සලාතය

05 රමධාන් කාලයේ පිළිපැදිය යුතුයි යනුවෙන් සඳහන් කළ කාර්යය නොවන්නේ,

(1) උපවාසයේ යෙදීම (2) සලාතුල් ඉස්තිහාරා නැමදීම

(3) ඉඃතිකාප් සිටීම (4) කරාවීහ් නැමදීම

06 නබි (සල්) තුමාණන් ළමාවියේ හැඳින් වූ නමක්වන්නේ,

(1) අල් අමීන් (2) අල්වහී (3) අල් ඉක්රාම් (4) අල් මුහ්සීන්

07 නබි (සල්) තුමාණන්ගේ ගෝත්‍රකයින් සමාජයින් වර්ජනය කර සිරගත කරනු ලැබූ ස්ථානය කුමක් ද?

(1) හිරා ගුහාව (2) තව්ර් ගුහාව

(3) ෂිඃබු අබීතාලිබ් නිම්නය (4) සකීපා බනී සාඉදා



මෙම ප්‍රශ්න පත්‍ර සියලුම සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිර්දේශ අනුව මුද්‍රණය, පැකට් කිරීම හා බෙදාහැරීම සිදුකර ඇත.

08 ''අබුල් අන්බියා'' (නබිවරුන්ගේ පියාණන්) යනුවෙන් හැඳින්වූයේ කවුරුන් ද?

(1) ආදම් (අලෛ) (2) මුහම්මද් (අලෛ) (3) ඊසා (අලෛ) (4) ඉබ්‍රාහිම් (අලෛ)

09 ''බිඋරු රූමා'' යනු ළිඳ මිලදීගෙන මුස්ලිම්වරුන් වෙනුවෙන් පරිත්‍යාග කලේ කවුරුන් ද?

(1) අබූබක්ර් (රලි) (2) උමර් (රලි) (3) උස්මාන් (රලි) (4) අලි (රලි)

10 උම්මහාතුල් මුඃමිනින් යන්නෙහි අර්ථය

(1) මුඃමින්වරුන්ගේ ශ්‍රේෂ්ඨයා (2) නබිවරුන්ගේ අවසානයා

(3) ස්වර්ගයෙන් පිදුම් ලැබූවන් (4) මුඃමින්වරුන්ගේ මව්වරුන්

- **පහත සඳහන් කරුණු නිවැරදි නම් (✓) යනුවෙන් ද වැරදි නම් (×) යනුවෙන් ද සඳහන් කරන්න.**

11 ''අල් අක්ෂා මස්ජිදය රාත්‍රියේ ගිය ගමන ''ඉස්රා'' යනුවෙන් හැඳින්වේ. ( )

12 අල්ලාහ් පැවසූ බවට නබි (සල්) තුමාණන් සඳහන් කළ හදීසයක් ''හදීස් නබවි යනුවෙන් හැඳින්වේ. ( )

13 අල්ලාහ්ට ස්තුතිය පුද කිරීම වෙනුවෙන් කරන සුජුදය ''සජ්දා සහ්වු'' වේ. ( )

14 යමෙක් දැනුම ලබා ගැනීම සඳහා යම් ගමනක නිරත වන්නේ ද ඔහුට ස්වර්ගයේ මග අල්ලා ලිහිල් කර දෙනු ඇත. ( )

15 අල්ලාහ්ට ආදේශ කිරීම කුඩා පවක් ලෙස සඳහන් වේ. ( )

- **පහත සඳහන් ප්‍රශ්නවලට සුදුසු වචන යොදා හිස්තැන් පුරවන්න.**

16 ''වහී මත්ලූව්'' හි ........................................................................................ අඩංගුවේ.

17 විවාහවීමට තහනම් අය අරාබියෙන් ................................................................................ යනුවෙන් හැඳින්වේ.

18 නබි (සල්) තුමාණන් ................................................................... ගුහාවේ තනිව සිටින විට දී වහී පහළ විය.

19 අල්කුර්ආනයට මීළඟ ස්ථානයේ සහීහ් බුහාරි හා....................................................... වැනි ග්‍රන්ථ සඳහන් වේ.

20 ''අල් මාඌන්'' යන්නෙහි අර්ථය ........................................................................... යනුවයි.

## II කොටස

- **පහත සඳහන් සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

(01) (1) ''දුආඋ'' යන්නෙහි අර්ථය කුමක් ද?
(2) ප්‍රාර්ථනා කිරීමට සුදුසු අවස්ථා තුනක් සඳහන් කරන්න.
(3) ප්‍රාර්ථනා කරනවිට පිළිපැදිය යුතු ක්‍රමවේද පහක් ලියන්න.
(2 + 3 + 5 = 10)

(02) (1) ''සකාත්'' යන්නෙහි අර්ථය කුමක් ද?
(2) හදීස්හි සඳහන් සදකාවන් තුනක් නම් කරන්න.
(3) සකාත් - සදකා අතර වෙනස්කම් පහක් සඳහන් කරන්න.
(2 + 3 + 5 = 10)

(03) (1) ඉස්ලාමීය මාසයන්වලින් රමධානය කීවෙනි මාසය ද?
(2) රමධාන් මාසයේ කුසල් අල්ලාහ් විසින් පිළිගැනීම සඳහා වැලකිය යුතු කරුණු තුනක් සඳහන් කරන්න.
(3) රමධාන් මාසයේ පිළිපැදීම සඳහා ඉස්ලාමය පෙන්වාදී ඇති යහපත් ක්‍රියාවන් පහක් සඳහන් කරන්න.
(2 + 3 + 5 = 10)

(04) (1) මදීනාවෙහි පැරණි නම කුමක් ද?
(2) නබි (සල්) තුමාණන් හට කුරේස්වරුන් කල හිංසා තුනක් සඳහන් කරන්න.
(3) පහත වචනවල අර්ථය සඳහන් කරන්න.
1. ආමුල් හුස්න් 2. මදීනතුන් නබි 3. ඉක්රඃ 4. සිද්දීක් 5. මිඃරාජ්
(2 + 3 + 5 = 10)

(05) (1) ''වහී කයිරු මත්ලුව්'' යන්නෙ අර්ථය කුමක් ද?
(2) හදීස් නබියෙහි සඳහන් කොටස් තුන සඳහන් කරන්න.
(3) හදීස් ග්‍රන්ථ පහක් සඳහන් කරන්න.
(2 + 3 + 5 = 10)

(06) (1) ජීවිතයේ පිළිපැදිය යුතු යහගුණාංග දෙකක් සඳහන් කරන්න.
(2) ජීවිතයේ වැළකී සිටිය යුතු දුර්ගුණාංග තුනක් සඳහන් කරන්න.
(3) අනාථයින්, වැන්දඹුවන්, දුප්පතුන් හට උපකාර කළ යුතු ක්‍රම පහක් සඳහන් කරන්න.
(2 + 3 + 5 = 10)

## පිළිතුරු පත්‍රය - I කොටස

(01)

## II කොටස

01